# රාජ්‍ය මූල්‍ය කටයුතු*

මෑත වර්ෂවල අයවැය ප්‍රතිපත්තියෙහි ප්‍රධාන අරමුණක් වූයේ මිල ස්ථාවරව පවත්වා ගැනීමයි. ලබා ගත හැකි සම්පත්වලට ගැලපෙන පරිදි මුළු වියදම සීමා කිරීමට දැඩි උත්සාහයක් ගනු ලැබුවේ, අයවැය හිඟයන් ආර්ථිකයට දැරිය හැකි අන්දමින් පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහාය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1980 දී සියයට 25 ක් වූ සමස්ත අයවැය හිඟය/දළ දේශීය නිෂ්පාදිත අනුපාතය 1984 දී සියයට 10 ක් දක්වා ක්‍රමයෙන් අඩු කරනු ලැබීය. මෙම වර්ෂ තුළදී අයවැය හිඟයන් ක්‍රමයෙන් අඩු කිරීම සහ රාජ්‍ය මූල්‍ය කටයුතු කළමනාකරණය වඩා යහපත් වීම මෑත වර්ෂවලදී උද්ධමන වේගය අඩු කිරීමට පිටිවහල් විය. එසේ වුවද, අපනයන මිළ ගණන් තියුණු ලෙස අඩු වීමෙන් රජයේ ආදායම් අඩු වීමත්, ආරක්ෂක කටයුතුවලට අදාළ වියදම් අධික වීම හා රාජ්‍ය ණය වෙනුවෙන් ගෙවනු ලබන පොළී ගෙවීම් වැඩි වීමත් නිසා 1985 අයවැය කටයුතුවලදී සම්පත් පරතරය අධික විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අයවැය කටයුතුවල ඇති වූ ශුද්ධ බලපෑම සාපේක්ෂ වශයෙන් වඩාත් ප්‍රසාරණාත්මක විය.

1985 අයවැය කටයුතු වලින් රටේ රාජ්‍ය මූල්‍ය ක්‍රමයේ ව්‍යුහාත්මක දුර්වලතාවයන් පිළිබිඹු විය. පහත වැටුණ රජයේ ආදායම් මගින් පෙනී ගියේ, සැලසුම්ගත වියදම් පියවා ගැනීමට වෙළෙඳ ද්‍රව්‍ය අපනයන බදු මත සහ සුළු ස්ථාවර විකල්ප ආදායම් කිහිපයක් මත පමණක් දැඩි රැඳියාවක් පවත්වා ගැනීමේ දුර්වලතාවයයි. අනෙක් අතට වියදම් කටයුතු වලින් පෙන්නුම් කළේ රජයේ ආදායම් පහත වැටීම්වලට අනුකූලව රජයේ වියදම් ගලපා ගැනීමේ කෙටිකාලීන දුෂ්කරතාවයන්ය. අයවැය ගත වියදම් සීමා කිරීමට දැරූ ප්‍රයත්නයන් එතරම් සඵල නොවූයේ අතිරේක වියදම් ප්‍රතිපාදන සැළකිය යුතු ලෙස වැඩිවීම සහ අත්තිකාරම් ගිණුම් කටයුතු වලින් ප්‍රමණ ඉක්මවා ණය දීම නිසාය.

වර්ෂය තුළ පැවති තත්ත්වයන් නිසා ආර්ථිකයට දැරිය හැකි මට්ටමක අයවැය හිඟය පවත්වා ගැනීම දුෂ්කර කාර්යයක් වූ නමුදු, 1980 දී ඇති වූ පොදු ආර්ථික අස්ථායීතාවය වැන්නක් නැවත ඇති වීම වළක්වා ගැනීම සඳහා මිළ ස්ථායීතාවය යෝග්‍ය ලෙස පවත්වාගෙන යාමේ අරමුණ අත්‍යාවශ්‍ය විය. එබැවින් මූල්‍ය ප්‍රතිපත්තිය කෙරෙහි දැඩි ලෙස රැඳී සිටීමට සිදු විය.

**අයවැය තත්ත්වය**

1985 සඳහා වූ ප්‍රතිශෝධිත ඇස්තමේන්තුවලට අනුව පසුගිය වසරට වඩා සියයට 1 ක සුළු අඩු වීමක් දක්වමින් මුළු ආදායම රුපියල් දශ ලක්ෂ 37,344 ක් විය. අපනයන භාණ්ඩ සඳහා වූ අසාමාන්‍ය ඉහළ මිළ ගණන් හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉහළ බදු ආදායමක් අත්දුටු 1984 වසරට සාපේක්ෂව බලන කල 1985 දී සියයට 23 ක් වූ ආදායම්/ද. දේ. නි. අනුපාතය පහළ මට්ටමක විය. කෙසේ වුවද, 1985 ආදායම්/ද. දේ. නි. අනුපාතය 1980–1983 කාලය තුළදී ලබා ගත් සාමාන්‍ය අනුපාතයට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි.

අත්තිකාරම් ගිණුම් ගෙවීම් ඇතුළුව මුළු වර්තන වියදමේ වර්ධන වේගය 1985 දී සියයට 12 ක් වූ අතර, එය 1984 පැවති සියයට 21 ක වර්ධන වේගය හා සසඳන කල ඉතා අඩු වේගයකි. කෙසේ වුවද, වර්තන වියදම/ද. දේ. නි. යෙහි අනුපාතයක් ලෙස 1984 දී වූ සියයට 21 හා සසඳන විට 1985 දී සියයට 22 දක්වා වැඩිවිය. වර්තන ගිණුම් කටයුතුවල සමස්ත ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ අතිරික්තය 1985 දී රුපියල් දශ ලක්ෂ 1,573 ක් වූ අතර, එය 1984 දී රුපියල් දශ ලක්ෂ 5,884 ක අතිරික්තයක් විය. 1985 දී වර්තන ගිණුමේ අතිරික්තය පහත වැටුනද, එය 1981 සිට දක්නට ලැබුණු වර්තන ගිණුමේ අතිරික්තයන් ජනනය කිරීමේ උපනතිය නොකඩවා පවත්වා ගෙනයාමක් විය.

---

* මෙම කොටස විශ්ලේෂණය කර ඇත්තේ, 1985 ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තු පදනම් කර ගෙනය. මෙම සංඛ්‍යා ලේඛණ වෙනස්වීමට ඉඩ ඇත.

වර්තන ගිණුමේ අතිරික්තයේ අඩු වීමක් තිබියදී වුවද, ඉහළ මට්ටමක වූ ණය ආපසු ගෙවීම් හේතුවෙන් ප්‍රාග්ධන වියදම් විශාල ලෙස වැඩිවිය. ණය ආපසු ගෙවීම් ඇතුළුව රුපියල් දශ ලක්ෂ 31,332 ක් වූ මුළු ප්‍රාග්ධන වියදම ඉකුත් වසරට වඩා සියයට 44 ක වැඩි වීමක් පෙන්නුම් කෙරිණ.

අයවැය හිඟය පියවීමේදී විදේශීය සම්පත් උපයෝගී කර ගැනීමේ සාපේක්ෂ වැදගත්කම 1985 වසරේදී අඩුවිය. මුළු විදේශීය මූල්‍යකරණය වූ රුපියල් දශ ලක්ෂ 12,894 මුළු අයවැය හිඟයෙන් සියයට 43 ක් වූ අතර, එය ඉකුත් වසරේ සියයට 71 ක් විය. කෙසේ වුවද, විදේශීය සම්පත් උපයෝගී කර ගැනීම සියයට 7 සිට 1985 දී සියයට 8 දක්වා වැඩි විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් දේශීය බැංකු නොවන මූලයන්ගෙන් ප්‍රයෝජනයට ගත් රුපියල් දශ ලක්ෂ 10,597 අයවැය හිඟයෙන් සියයට 30 ක් වූ අතර, එය 1984 දී සියයට 42 ක් විය.

අයවැය හිඟය පියවීමට රුපියල් දශ ලක්ෂ 7,127 ක් බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ලදී. කෙසේ වුවද, බැංකු ක්‍රමය තුළ රජයේ මුදල් ශේෂ හා තැන්පතු රුපියල් දශ ලක්ෂ 1,098 කින් වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් හිඟයේ ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශ ලක්ෂ 6,029 කට සීමා විය. අයවැය කටයුතු හා සම්බන්ධ දත්තයන් ඉකුත් වසරේ සංසන්දනාත්මක සංඛ්‍යා සමඟ 1 : 39 සංඛ්‍යා සටහන මගින් දක්වා ඇත.

UNIVERSITY OF MORATUWA
LIBRARY
SRI LANKA

## 1.39 සංඛ්‍යා සටහන
## රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය

| | රුපියල් දශ ලක්ෂ | | | ද.දේ.නි. අනුපාතය (%) | | |
|---|---|---|---|---|---|---|
| | 1983 | 1984 | 1985 | 1983 | 1984 | 1985 |
| 1. ආදයම | 25,210 | 37,731 | 37,344 | 20·7 | 24·5 | 23·4 |
| බදු ආදයම .. | 20,701 | 31,215 | 30,815 | 17·0 | 20·3 | 19·3 |
| බදු නොවන ආදයම .. | 4,509 | 6,516 | 6,529 | 3·7 | 4·2 | 4·1 |
| 2. වියදම .. | 46,816 | 53,592 | 67,103 | 38·5 | 34·9 | 42·0 |
| වර්තන වියදම .. | 25,083 | 31,842 | 35,771 | 20·6 | 20·7 | 22·4 |
| ප්‍රාග්ධන වියදම .. | 21,733 | 21,750 | 31,332 | 17·9 | 14·1 | 19·6 |
| 3. වර්තන ගිණුම් අතිරික්තය (+)/ හිඟය(—) .. | 127 | 5,889 | 1,573 | 0·1 | 3·8 | 1·0 |
| 4. සමස්ත ශේෂය .. | 21,606 | 15,861 | 29,759 | 17·8 | 10·3 | 18·6 |
| 5. ණය ආපසු ගෙවීම් .. | 5,302 | 2,229 | 6,709 | 4·4 | 1·4 | 4·2 |
| 6. ශුද්ධ මූල්‍ය හිඟය .. | 16,580 | 13,632 | 23,050 | 13·6 | 8·9 | 14·4 |
| 7. අයවැය හිඟය පියවීම | | | | | | |
| විදේශීය .. | 10,950 | 11,251 | 12,894 | 9·0 | 7·3 | 8·1 |
| දේශීය .. | 11,350 | 3,944 | 17,963 | 9·3 | 2·6 | 11·2 |
| බැංකු .. | 1,204 | −2,644 | 7,366 | 1·0 | − 1·7 | 4·6 |
| බැංකු නොවන .. | 10,146 | 6,588 | 10,597 | 8·3 | 4·3 | 6·6 |
| මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම .. | − 694 | 666 | − 1,098 | − 0·6 | 0·4 | − 0·7 |
| 8. ශුද්ධ මූල්‍ය හිඟය පියවීම | | | | | | |
| විදේශීය .. | 9,786 | 9,785 | 11,105 | 8·0 | 6·4 | 6·9 |
| දේශීය .. | 7,489 | 3,181 | 13,043 | 6·2 | 2·1 | 8·2 |
| බැංකු .. | 1,168 | −2,760 | 7,127 | 1·0 | 1·8 | 4·5 |
| බැංකු නොවන .. | 6,321 | 5,942 | 5,916 | 5·2 | 3·9 | 3·7 |
| මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම .. | − 694 | 666 | − 1,098 | − 0·6 | 0·4 | − 0·7 |
| 9. රාජ්‍ය මූල්‍ය කටයුතු නිසා ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑම .. | 474 | −2,095 | 6,029 | 0·4 | −1·4 | 3·8 |

මූලයන් : මහා භාණ්ඩාගාරය,
ශ්‍රී ලංකා මහ බැංකුව.

**ආදායම**

1985 වසරේදී රජයේ ආදායම රුපියල් දශ ලක්ෂ 37,344 ක් විය. පසුගිය වසරේ වූ සියයට 50 ක ආදායම් වර්ධන වේගය හා සසඳන කල, මෙය සියයට 1 ක අඩුවීමකි. 1984 වසරේදී රජයේ ආදායම රජයේ මුළු වියදමින් සියයට 70 ක් වූ නමුදු, එය 1985 වසරේදී සියයට 56 දක්වා අඩුවූ අතර, රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් සලකන විට සියයට 25 සිට සියයට 23 දක්වා අඩුවිය.

ආදායම, නිෂ්පාදනය සහ වියදම මත පැනවූ බදුවලින් ලත් මුලු බදු ආදායම රුපියල් දශ ලක්ෂ 30,815 ක් වූ අතර, එය 1984 වසරේදී රුපියල් දශ ලක්ෂ 31,215 ක් විය. බදු ආදායමේ මෙම අඩුවීමට විශාල වශයෙන් හේතු වූයේ අපනයන මත වූ බදු ආදායම අඩුවීමය. 1985 වසරේදී රුපියල් දශ ලක්ෂ 6,529 ක් වූ බදු නොවන ආදායම ආන්තික වැඩිවීමක් පෙන්නුම් කෙරිණ.

පෞද්ගලික ආදායම් බදු සහ සාමූහික ආදායම් බදුවලින් සමන්විත ආදායම් බදු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,852 ක් වූ අතර, එය රජයේ බදු ආදායමින් සියයට 19 ක් විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ආදායම් බදු ලැබීම් පසුගිය වසරේ මෙන්ම සියයට 3.6 ක්ව පැවතුණි. ජාතික ආදායමේ වෙනස්වීමට අනුරූපව ආදායම් බදු ලැබීම් වෙනස්වීම් මැන දක්වෙන, ආදායම් බදු සංවේදිතා සංගුනකය, 1984 දී 2.4 සිට 1985 දී 1.7 දක්වා පහත වැටුණි. වසර තුළදී, මුලු ආදායම් බදුවලින්, සියයට 21 ක් වූ පෞද්ගලික ආදායම් බදු සියයට 30 කින් පහත වැටී, රුපියල් දශ ලක්ෂ 1,225 ක් විය. ඉකුත් වසරේදී පෞද්ගලික ආදායම් බදු ලැබීම්හි වර්ධන වේගය ආසන්න වශයෙන් සියයට සියයක් විය. බදු අනුපාතිකයන් අඩු කිරීම, බදු කාණ්ඩ පුළුල් කිරීම, බදු නිදහස් සීමාව ඉහළ දැමීම සහ 1985 වසරේදී පුනරුත්ථාපන බද්ද අහෝසි කිරීම, පෞද්ගලික ආදායම් බදු ලැබීම් තියුණු ලෙස පහත වැටීමට බෙහෙවින් බලපෑහ. මෙම තත්ත්වයට ප්‍රතිවිරුද්ධව 1985 වසරේදී රුපියල් දශ ලක්ෂ 4,627 ක් වූ සාමූහික ආදායම් බදු ලැබීම්, සියයට 24 කින් ඉහළ නැඟුණි. 1984 වර්ෂයේදී සාමූහික බදු ආදායමේ වර්ධන වේගය සියයට 50 ක් විය.

නිෂ්පාදනය හා වියදම මත වූ මුලු බදු (අපනයන බදු, ආනයන බදු, පිරිවැටුම් බදු, සුරා බදු සහ බලපත්‍ර බදු) ආදායම රුපියල් දශ ලක්ෂ 24,908 ක් වූ අතර, එය 1984 වසරට වඩා සුළු වශයෙන් පහත වැටීමක් පෙන්නුම් කෙරිණි. නිෂ්පාදනය හා වියදම මත වූ බදු ආදායම මුලු බදු ආදායමින් සියයට 81 ක් වූ අතර, එය 1984 වසරේදී සියයට 49 ක ඉහළ යාම හා සසඳන කල 1985 දී සියයට 3 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

අපනයන භාණ්ඩයන්ගේ සමස්ත මිළ අඩුවීම සහ නිෂ්පාදකයන්ගේ ලාභ ආන්තිකයන් සුරකෙන පරිදි, බදු අනුපාතයන් ගැලපීමට රජය විසින් ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති නිසා, රජයේ ආදායමේ අපනයන බදු ආදායමෙහි සාපේක්ෂ වැදගත්කම අඩුවීමට හේතුවිය. 1984 වසරේදී සියයට 29 කින් ඉහළ ගිය අපනයන බදු ආදායමට ප්‍රතිවිරුද්ධව 1985 වසරේදී සියයට 41 ක පහත වැටීමක් පෙන්නුම් කරමින් අපනයන බදු ආදායම රුපියල් දශ ලක්ෂ 1,870 ක් විය. 1985 වසරේදී රජයේ ආදායමෙහි, අපනයන බදු ආදායමේ සාපේක්ෂ කොටස සැලකිය යුතු ලෙස අඩු විය. 1978-84 කාල පරිච්ඡේදයේදී, ආසන්න වශයෙන් රජයේ බදු ආදායමින් සියයට 24 ක් වූ අපනයන බදු ආදායම, 1985 දී සියයට 6 දක්වා අඩු වූ අතර, අපනයන බදු/දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකය සියයට 1 දක්වා අඩු විය.

අපනයන බදු අනුපාතයන් අඩු කිරීම සහ අපනයන පරිමාවෙහි වූ ආන්තික අඩුවීම හේතුකොට ගෙන තේ අපනයන බදු ආදායම සියයට 33 කින් පහත වැටුණු අතර, රබර් අපනයන බදු ආදායම් සියයට 75 කින් පහත වැටුනි. බදු අනුපාතයන්ගේ අඩු කිරීමක් තිබියදී වුවද, අපනයන පරිමාවෙහි සැලකිය යුතු වැඩිවීම හේතුකොට ගෙන පොල් නිෂ්පාදන ආශ්‍රිත අපනයන බදු ලැබීම් සියයට 4 කින් වැඩිවිය.

ආනයන බදු ලැබීම් ඉකුත් වසරට වඩා සියයට 6 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 8,397 ක් විය. ආනයන බදු 1985 වසරේ රජයේ බදු ආදයමින් සියයට 27 ක්වූ අතර, ඉකුත් වසරෙහි දී එය සියයට 25 ක් විය. දේශීය කර්මාන්තයනට සඵල ආරක්ෂණ බදු අනුපාත සැපයීමේ පදනම මත ජනාධිපති තීරුබදු කොමිෂන් සභාව විසින් ආනයන බදු ව්‍යුහය ක්‍රමවත් කිරීම පිණිස, ඉදිරිපත් කළ යෝජනා ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන්, ආනයනයන්හි දේශීය වටිනාකම වැඩිවීමක් තිබියදී වුවද, ආනයන බදු ආදයම වැඩි වූයේ ආන්තික වශයෙනි.

වටිනාකම අනුව අය කරන තේ බදු, දුම්කොළ හා මත්පැන් මත වූ සුරා බදුවලින් සමන්විත වරණ අලෙවි බදු ආදයම, රුපියල් දශ ලක්ෂ 3,928 ක් වූ අතර, එය රජයේ බදු ආදයමින් සියයට 13 ක් විය. තේ මිළ ගණන් තියුණු ලෙස පහත වැටීම හේතුවෙන් වටිනාකම අනුව අය කරන තේ බදු ආදයම සියයට 68 ක විශාල වශයෙන් අඩුවීමක් පෙන්නුම් කෙරිණි. මත්පැන් මත වූ සුරා බදු, සුලු වශයෙන් වැඩි විය. වසර තුළදී දුම්කොළ බදු ආදයම රුපියල් දශ ලක්ෂ 1,878 ක් වූ අතර, ඉකුත් වසරේදී එය රුපියල් දශ ලක්ෂ 1,537 ක් විය. මෙම වැඩි වීමට හේතු වූයේ, බදු අනුපාතිකයන් ඉහළ දැමීම සහ ඉහළ විකුණුම් පරිමාවය. වරණ අලෙවි බදු වෙතින් වූ ආදයම් අඩු වීමට හේතු වූයේ මත්පැන් හා දුම්කොළ බදු ආදයමෙන් වැඩි වූ ආදයමට වඩා තේ බදුවලින් ලැබුණු ආදයම අඩු වීමය.

පිරිවැටුම් බදු, පිළිවෙලින් සිව් වැනි වසර සඳහාද, රජයේ විශාලතම ආදයම් ප්‍රභවය විය. වසර තුළදී රුපියල් දශ ලක්ෂ 10,195 ක් වූ පිරිවැටුම් බදු ආදයම, ඉකුත් වසරට වඩා සියයට 25 ක වැඩි වීමක් වාර්තා කළේය. බදු ආදයමෙන් පිරිවැටුම් බදු ආදයම් කොටස 1984 සියයට 26 සිට 1985 දී සියයට 33 දක්වා වැඩි වූ අතර, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව 1984 දී සියයට 5.3 සිට 1985 දී සියයට 6.4 දක්වා වැඩිවිය. දළ දේශීය නිෂ්පාදිතයේ වෙනස්-වීම්වලට අනුකූලව, පිරිවැටුම් බදු ආදයමේ ප්‍රතිචාරය මැන දැක්වෙන පිරිවැටුම් බදු සංවේදිතා සංගුණකය 1984 දී 1.89 සිට 1985 දී 2.51 දක්වා ඉහළ ගියේය. බදු පදනම පුලුල් කිරීමේ අරමුණින්, 1985 අයවැයෙන් හඳුන්වා දුන් නව ආදයම් ක්‍රියාමාර්ගයන්, මෙම ඉහළ පිරිවැටුම් බදු සංවේදිතාවයට හේතු විය. බදු අනුපාතිකයන් ඉහළ දැමීම, බදු පදනම පුලුල් කිරීම සහ මනා ලෙස බදු නීති ක්‍රියාත්මක කිරීම, මෙම ක්‍රියා මාර්ගයන්හි අන්තර්ගත විය. නිෂ්පාදන අංශයෙන් වූ පිරිවැටුම් බදු ලැබීම් සියයට 19 කින් ඉහළ නැග, රුපියල් දශ ලක්ෂ 3,619 ක් වූ අතර, නිෂ්පාදන නොවන අංශයෙන් වූ ලැබීම් සියයට 42 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 2,746 ක් විය. ආනයන මත වූ පිරිවැටුම් බදු ආදයම සියයට 21 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 3,830 ක් විය.

බලපත්‍ර ගාස්තුවල වැඩි කිරීමක් තිබියදී වුවද, එමගින් ලත් ආදයම සුලු වශයෙන් අඩු වී රුපියල් දශ ලක්ෂ 190 ක් විය. වත්කම් පැවරීම් බදු මගින් ලත් ආදයම රුපියල් දශ ලක්ෂ 328 ක් වූ අතර, එය සියයට 19 ක අඩු වීමක් පෙන්නුම් කළේය.

බදු නොවන ආදයම රුපියල් දශ ලක්ෂ 6,529 ක් වූ අතර, එය 1985 වසරේ රජයේ ආදයමින් සියයට 18 ක් විය. නිදන් අරමුදල් ආයෝජන වලින් ලත් ලැබීම් වැඩි වූ නිසා පොළී ආදයම සියයට 72 කින් වැඩි විය. ලාභ සහ ලාභාංශ ආදයම සියයට 24 කින් අඩු වී රුපියල් දශ ලක්ෂ 425 ක් විය. මෙම බදු නොවන ආදයමෙහි, මහ බැංකුව වෙත වූ රජයේ ණය වගකීම් පියවා ගැනීම පිණිස පවරන ලද රුපියල් දශ ලක්ෂ 1,500 ක්ද ඇතුලත්ය.

රජයේ ආදයමෙහි ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරන දර්ශක 1.40 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## 1.40 සංඛ්‍යා සටහන

## රජයේ ආදායම් ක්‍රියාවලිය*

| | වර්ධන අනුපාතිකය (%) | | | ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් | | | මුළු ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1983 | 1984 | 1985 | 1983 | 1984 | 1985 | 1983 | 1984 | 1985 |
| 1. බදු ආදායම .. | 34·2 | 50·8 | – 1·3 | 17·0 | 20·3 | 19·3 | 82·1 | 82·7 | 82·5 |
| 1.1 නිෂ්පාදන හා වියදම් මත පැනවූ බදු .. | 32·5 | 48·5 | – 2·9 | 14·2 | 16·7 | 15·6 | 68·5 | 68·0 | 66·7 |
| 1.1.1 පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු .. | 53·6 | 30·8 | 25·2 | 5·1 | 5·3 | 6·4 | 24·7 | 21·6 | 27·3 |
| 1.1.2 වරණ අලෙවි බදු .. | 42·1 | 79·2 | –32·1 | 2·7 | 3·8 | 2·4 | 12·8 | 15·3 | 10·5 |
| 1.1.3 ආනයන බදු .. | 50·1 | 64·3 | 5·6 | 4·0 | 5·2 | 5·2 | 19·2 | 21·1 | 22·5 |
| 1.1.4 අපනයන බදු .. | – 1·0 | 29·1 | –41·1 | 2·0 | 2·1 | 1·2 | 9·8 | 8·4 | 5·0 |
| 1.1.5 බලපත්‍ර ගාස්තු .. | 29·6 | 3·3 | – 2·1 | 0·1 | 0·1 | 0·1 | 0·7 | 0·5 | 0·5 |
| 1.1.6 දේපල පැවරුම් බදු .. | 30·7 | 21·2 | – 0·4 | 0·3 | 0·3 | 0·2 | 1·3 | 1·1 | 0·9 |
| 1.2 සාමූහික සහ සාමූහික නොවන ආදායම් මත පැනවූ බදු .. | 15·2 | 62·7 | 6·8 | 2·7 | 3·6 | 3·6 | 13·4 | 14·5 | 15·7 |
| 1.2.1 සාමූහික .. | 17·1 | 50·3 | 24·4 | 2·0 | 2·4 | 2·9 | 9·8 | 9·8 | 12·4 |
| 1.2.2 සාමූහික නොවන .. | 10·4 | 97·4 | –30·4 | 0·7 | 1·1 | 0·7 | 3·6 | 4·7 | 3·3 |
| 1.3 ප්‍රාග්ධන පැවරුම් බදු .. | – 7·2 | 36·1 | –32·9 | 0·1 | 0·1 | ... | 0·2 | 0·2 | 0·1 |
| 2. බදු නොවන ආදායම .. | 80·8 | 44·5 | 0·2 | 3·7 | 4·2 | 4·1 | 17·9 | 17·3 | 17·5 |
| 2.1 රාජ්‍ය වෙළෙඳ ව්‍යවසායයන්හි දළ ලැබීම් .. | 14·5 | 42·0 | –4·7 | 1·1 | 1·2 | 1·1 | 5·2 | 5·0 | 4·7 |
| 2.2 පොළී ලාභ සහ ලාභාංශ .. | 71·4 | 143·1 | 39·2 | 0·6 | 1·1 | 1·4 | 2·7 | 4·3 | 6·2 |
| 2.3 විකුණුම් සහ ගාස්තු .. | –23·7 | 24·0 | 5·5 | 0·2 | 0·3 | 0·3 | 1·4 | 1·2 | 1·5 |
| 2.4 සමාජ සංරක්ෂණ දායක මුදල් .. | – 0·6 | 19·0 | 7·1 | 0·1 | 0·1 | 0·1 | 0·3 | 0·2 | 0·2 |
| 2.5 අනෙකුත් වර්තන පැවරුම් .. | 122·0 | –30·0 | –39·1 | 0·1 | 0·1 | 0·1 | 1·8 | 0·8 | 0·1 |
| 2.6 ප්‍රාග්ධන භාණ්ඩ විකුණුම් .. | –52·3 | 32·6 | 53·8 | ... | .. | ... | ... | ... | 0·1 |
| 2.7 ණය සහ අත්තිකාරම් ආපසු ගෙවීම් .. | 54·6 | 252·1 | –58·1 | 0·1 | 0·3 | 0·1 | 0·6 | 1·4 | 0·6 |
| 2.8 මහ බැංකු මාරුකිරීම් .. | — | 10·0 | – 9·1 | 1·2 | 0·9 | 0·9 | 6·0 | 4·4 | 4·0 |
| එකතුව .. | 41·6 | 49·7 | – 1·0 | 20·7 | 24·7 | 23·4 | 100·0 | 100·0 | 100·0 |

* රජයේ ආදායම පිළිබඳ වැඩි විස්තර සංඛ්‍යා ලේඛන පරිශිෂ්ඨයේ දක්වා ඇත.

මූලයන්: මහා භාණ්ඩාගාරය,
ශ්‍රී ලංකා මහ බැංකුව.

වියදම

වර්තන හා ප්‍රාග්ධන ගිණුම්වලින් සමන්විත රජයේ වියදම 1985 දී රුපියල් දශ ලක්ෂ 67,103 ක්වූ අතර, 1984 සියයට 15 ක වැඩිවීම සමඟ සසඳන කල එය සියයට 25 ක වැඩිවීමකි. මුළු වියදමේ ඉහළ වර්ධනයක් පිළිබිඹු කරමින් වියදම/ද. දේ. නි. අනුපාතය 1984 දී සියයට 35 සිට 1985 දී සියයට 42 දක්වා වැඩිවිය. 1985 දී මුළු වියදමෙහි වූ මෙම වැඩිවීමට විශාල වශයෙන් දයක වූ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 9,582 කින් හෙවත් සියයට 44 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 31,332 ක්වූ අතර, සැසඳීමේදී ඉකුත් වසරේ වැඩිවීම සියයට 1 ටත් වඩා අඩුවිය.

අත්තිකාරම් ගිණුම්වලින් ගෙවීම් කළ රුපියල් දශ ලක්ෂ 2,150 ද ඇතුලත්ව මුළු වර්තන වියදම රුපියල් දශ ලක්ෂ 35,771 වූ අතර, එය පසුගිය වසරට වඩා සියයට 12 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, වර්තන වියදම් අඩු වර්ධන වේගයන් සළකුණු කරමින් වර්තන වියදම්/ද. දේ. නි. අනුපාතය 1984 සියයට 21 සිට 1985 දී සියයට 22 දක්වා ආන්තික වශයෙන් වැඩිවිය. වර්තන වියදම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ ආරක්ෂක කටයුතු වලට අදල වියදම් වැඩිවීමය.

1985 දී භාණ්ඩ හා සේවා මත වූ වියදම මුළු වර්තන වියදමින් සියයට 44 ක් වී රුපියල් දශ ලක්ෂ 15,904 ක් විය. පසුගිය වසරෙහි දී මෙම වියදම රුපියල් දශ ලක්ෂ 13,646 කි. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව භාණ්ඩ හා සේවාමත වූ වියදම 1984 දී සියයට 9 සිට 1985 දී සියයට 10 ක් දක්වා වැඩිවිය. භාණ්ඩ සහ සේවා මත වූ මුළු වියදමින් රුපියල් දශ ලක්ෂ 7,730 ක් වැටුප් සහ වේතන මත වූ අතර, මෙය පසුගිය වසරට වඩා සියයට 22 ක වැඩි වීමකි. ගුරු වැටුප් වැඩි කිරීම සහ ආරක්ෂක අංශයේ නියුතු පිරිස් සඳහා වූ ඉහළ වැටුප් වියදම් මෙම වැටුප් සහ වේතන වියදම වැඩිවීමට හේතු විය. අනෙකුත් භාණ්ඩ සහ සේවා සඳහා වූ රුපියල් දශ ලක්ෂ 8,174 ක වියදමෙහි මහවැලි සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් වූ බදු ගෙවීම් සඳහා රුපියල් දශ ලක්ෂ 1,848 ක්ද, ආනයන බදු ප්‍රතිදනය මත වූ රුපියල් දශ ලක්ෂ 500 ක්ද, වෙළෙඳ ව්‍යවසායයන් සඳහා වූ රුපියල් දශ ලක්ෂ 981 ක්ද, ආරක්ෂක කටයුතු මත වූ රුපියල් දශ ලක්ෂ 1,498 ක්ද ඇතුලත්ය.

වසර තුලදී රාජ්‍ය සංස්ථාවනට කෙරුණු වර්තන සංක්‍රාමයන් රුපියල් දශ ලක්ෂ 1,675 ක් වූ අතර, එය පසුගිය වසරට වඩා සියයට 10 ක අඩුවීමකි. මෙයින් රුපියල් දශ ලක්ෂ 1,025 ක් පොහොර සහනාධාරය සඳහා (රුපියල් දශ ලක්ෂ 1,000) - සහ ජාතික කිරි මණ්ඩල සහනාධාර (රුපියල් දශ ලක්ෂ 25) වශයෙන් වෙන් කරනලදී. වසර තුලදී ඇතැම් සංස්ථාවන්ගේ මෙහෙයුම් අලාභ පියවා ගැනීම සඳහා රුපියල් දශ ලක්ෂ 100 මාරු කෙරිණි. මෙම සංක්‍රාමයන්ගේ ප්‍රධාන ප්‍රතිග්‍රාහකයින් වූයේ ජාතික සංවර්ධන බැංකුව (රුපියල් දශ ලක්ෂ 27) සහ රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 42) ය. පළාත් පාලන අධිකාරයන් සහ අනෙකුත් ආයතනවලට කෙරුණු සංක්‍රාම 1985 දී රුපියල් දශ ලක්ෂ 1,364 ක් වූ අතර, සැසඳීමේදී 1984 එය රුපියල් දශ ලක්ෂ 648 ක් විය.

1985 වසරේදී ගෘහ අංශය වෙත කෙරුණු සංක්‍රාම සියයට 16 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 6,151 ක් විය. මෙම සංක්‍රාම කිරීම් විශ්‍රාම වැටුප් (රුපියල් දශ ලක්ෂ 2,364), ආහාර මුද්දර (රුපියල් දශ ලක්ෂ 1,437), ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ගෙවන ලද පොළී සහනාධාර (රුපියල් දශ ලක්ෂ 495), භූමිතෙල් මුද්දර (රුපියල් දශ ලක්ෂ 422), පාසැල් සිසුන් සඳහා නොමිලේ පොත් (රුපියල් දශ ලක්ෂ 60), පාසැල් සිසුන් සඳහා දිවා ආහාර සැපයීම් (රුපියල් දශ ලක්ෂ 57), සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ සුභසාධන ගෙවීම් (රුපියල් දශ ලක්ෂ 278) සහ ලාභදයී නොවන මාර්ගයන්හි වියදම් පියවීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත සපයන සහනාධාර (රුපියල් දශ ලක්ෂ 135) වලින් සමන්විත විය.

## 1.41 සංඛ්‍යා සටහන

## රජයේ වියදම

| | රුපියල් දශ ලක්ෂ | | | වර්ධන අනුපාතිකය (%) | | | ද. දේ. නි. අනුපාතය (%) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1983 | 1984 | 1985 | 1983 | 1984 | 1985 | 1983 | 1984 | 1985 |
| 1. වර්තන වියදම .. | 25,083 | 31,842 | 35,771 | 30·4 | 26·0 | 12·3 | 20·6 | 20·7 | 22·4 |
| 1.1 භාණ්ඩ හා සේවා සඳහා වියදම .. | 10,316 | 13,646 | 15,904 | 18·9 | 32·3 | 16·5 | 8·5 | 8·9 | 9·9 |
| 1.1.1 වැටුප් හා වේතන .. | 5,577 | 6,313 | 7,730 | 11·1 | 13·2 | 22·4 | 4·6 | 4·1 | 4·8 |
| 1.1.2 අනෙකුත් භාණ්ඩ හා සේවා .. | 4,739 | 7,333 | 8,174 | 29·8 | 54·7 | 11·5 | 3·9 | 4·8 | 5·1 |
| 1.2 සංක්‍රාම ගෙවීම් .. | 13,647 | 15,280 | 17,717 | 19·3 | 12·0 | 15·9 | 11·2 | 9·9 | 11·1 |
| 1.2.1 රාජ්‍ය සංස්ථාවනට පැවරුම් .. | 1,958 | 1,865 | 1,675 | 15·4 | − 4·7 | −10·2 | 1·6 | 1·2 | 1·0 |
| 1.2.2 කුටුම්භ සඳහා පැවරුම් .. | 4,474 | 5,321 | 6,151 | 8·0 | 18·9 | 15·6 | 3·7 | 3·5 | 3·8 |
| 1.2.3 පළාත් පාලන අධිකාරීන්ට සහ අනෙකුත් ආයතනයන්ට පැවරුම් .. | 609 | 648 | 1,364 | 23·0 | 6·4 | 110·5 | 0·5 | 0·4 | 0·9 |
| 1.2.4 රාජ්‍ය ණය සඳහා පොළී .. | 6,606 | 7,446 | 8,527 | 29·4 | 12·7 | 14·5 | 5·4 | 4·8 | 5·3 |
| 1.3 අත්තිකාරම් ගිණුම් ගෙවීම් .. | 1,120 | 2,916 | 2,150 | 227·4 | 160·4 | −26·3 | 0·9 | 1·9 | 1·3 |
| 2. ප්‍රාග්ධන වියදම .. | 21,733 | 21,750 | 31,332 | 16·4 | 0·1 | 44·1 | 17·9 | 14·1 | 19·6 |
| 2.1 ණය ආපසු ගෙවීම් .. | 5,302 | 2,229 | 6,709 | 102·9 | −57·9 | 200·9 | 4·4 | 1·4 | 4·2 |
| 2.2 රාජ්‍ය සංස්ථාවන්ට ප්‍රාග්ධන පැවරුම් .. | 10,133 | 11,845 | 11,691 | − 3·2 | 17·0 | − 1·3 | 8·3 | 7·7 | 7·3 |
| 2.3 පළාත් පාලන අධිකාරීන්ට, ආයතනයන්ට සහ විදේශයන්ට ප්‍රාග්ධන පැවරුම් | 328 | 242 | 408 | 80·2 | 26·2 | 68·6 | 0·3 | 0·2 | 0·3 |
| 2.4 මූල්‍ය වත්කම් අත්කර ගැනීම් .. | 801 | 901 | 1,770 | 11·6 | 12·5 | 96·4 | 0·7 | 0·6 | 1·1 |
| 2.5 රජයේ දෙපාර්තමේන්තුවලට වෙන්කිරිම් .. | 5,179 | 6,533 | 10,754 | 10·3 | 26·1 | 64·6 | 4·3 | 4·2 | 6·7 |
| 3. මුළු වියදම .. | 46,816 | 53,592 | 67,103 | 23·5 | 14·5 | 25·2 | 38·5 | 34·9 | 42·0 |

මූලයන් : මහා භාණ්ඩාගාරය,
ශ්‍රී ලංකා මහ බැංකුව.

රාජ්‍ය ණය මත වූ පොළී ගෙවීම් ඉකුත් වසරට වඩා සියයට 15 ක වැඩිවීමක් පිළිබිඹු කරමින් රුපියල් දශ ලක්ෂ 8,527 ක් විය. පොළී ගෙවීම් වර්තන වියදමෙහි ප්‍රතිශතයක් සේ ගත්කළ සියයට 24 ක් වූ අතර, ඉකුත් වසරේදී එය සියයට 23 ක් විය.

1985 වසර තුළදී අත්තිකාරම් ගිණුම් කටයුතුවලින් ඇතිවූ ශුද්ධ ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,150 ක් වූ අතර, 1984 දී එය රුපියල් දශ ලක්ෂ 2,916 ක් විය.

අත්තිකාරම් ගිණුම් යටතේ ඇති වූ ශුද්ධ ගෙවීම් ප්‍රමාණයේ වැඩිවීමට හේතුවූයේ රජයේ දෙපාර්තමේන්තු අත්තිකාරම් ගිණුම් වලින් හා අතිරික්ත ශේෂයන්ගෙන් දෙන ලද ණය සහ ගබඩා සහ ද්‍රව්‍ය අත්තිකාරම් ගිණුම්හි ඇති වූ බලපෑමය. 1985 ප්‍රධාන අත්තිකාරම් ගෙවීම් වූයේ ආහාර මිළදී ගැනීමේ සහ බෙදා හැරීමේ ගිණුම (රුපියල් දශ ලක්ෂ 1,130), රාජ්‍ය සංස්ථා (රුපියල් දශ ලක්ෂ 705), රජයේ බෙහෙත් ගබඩා (රුපියල් දශ ලක්ෂ 187), විදුලි සංදේශ ගබඩා ගිණුම (රුපියල් දශ ලක්ෂ 63) සහ දුම්රිය දෙපාර්තමේන්තුව (රුපියල් දශ ලක්ෂ 33) ය.

වසර තුළදී මුළු දළ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 31,332 ක් විය. මෙම සියයට 44 ක් වූ ප්‍රාග්ධන වියදම් වැඩි වීමට මූලික වශයෙන් හේතු වූයේ රුපියල් ණය ආපසු ගෙවීම් ඉහළ යාම සහ නිදන් අරමුදල් කටයුතු අහෝසි කිරීමය.


ණය ආපසු ගෙවීම් රහිතව ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 24,623 ක් වූ අතර, එය 1984 ට වඩා සියයට 26 ක වැඩි වීමක් පෙන්නුම් කළේය. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ශුද්ධ ප්‍රාග්ධන වියදම 1984 දී සියයට 13 සිට 1985 දී සියයට 15 දක්වා වැඩි විය.

මුළු ප්‍රාග්ධන වියදමින් වසර තුළදී රාජ්‍ය සංස්ථාවන්ට කෙරුණු සංක්‍රාමයන් ඉකුත් වසරට වඩා සියයට 1 ක ආන්තික අඩු වීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 11,691 ක් විය. මහවැලි සංවර්ධන වැඩපිළිවෙල සඳහා වූ රුපියල් දශ ලක්ෂ 5,492 ක්ද, ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය සඳහා වූ රුපියල් දශ ලක්ෂ 1,095 ක්ද, මෙම සංක්‍රාමයන්හි ඇතුළත් විය. ණය වශයෙන් ඇතැම් සංස්ථාවනට බෙදා හළ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 1,770 ක් වූ අතර, ඉකුත් වසර හා සැසඳීමේදී මෙම ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 901 ක් විය. මෙම ණය වලින් වැඩි ප්‍රමාණයක් සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ ව්‍යාපෘතීන්හි ආයෝජනය කිරීම පිණිස ලංකා විදුලි බල මණ්ඩලය විසින් ලබා ගන්නා ලදී. පළාත් පාලන අධිකාරයනට කෙරුණු ප්‍රාග්ධන සංක්‍රාම රුපියල් දශ ලක්ෂ 64 ක් වූ අතර, අනිකුත් ආයතනයනට කෙරුණු සංක්‍රාම රුපියල් දශ ලක්ෂ 269 ක් විය. රජයේ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ වෙනුවෙන් දැරූ ප්‍රාග්ධන වියදම ඉකුත් වසරට වඩා සියයට 65 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 10,754 ක් විය. කෙසේ වුවද, 1985 දී ප්‍රාග්ධන වියදමෙහි වාර්තාගත ඌන වියදම් ප්‍රමාණය සියයට 6ක් විය. රජයේ වියදම පිළිබඳ විස්තරාත්මක බෙදා වෙන් කිරීමක් 1.41 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**අයවැය හිඟය සහ එය පියවීම**

1985 වසරෙහි රජයේ අයවැය කටයුතු වලින් රුපියල් දශ ලක්ෂ 29,759 ක අයවැය හිඟයක් ඇති විය. එය පසුගිය වසරට වඩා ආසන්න වශයෙන් දෙගුණයක වැඩි වීමකි. සමස්ත අයවැය හිඟය, මුළු රජයේ වියදමින් සියයට 44 ක් වූ අතර 1984 දී එය සියයට 30 ක් විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් සේ සමස්ත අයවැය හිඟය 1984 දී සියයට 10 සිට 1985 දී සියයට 19 දක්වා වැඩි විය. 1985 දී රුපියල් දශ ලක්ෂ 23,050 ක් වූ ශුද්ධ මූල්‍ය හිඟය පසුගිය වසරට වඩා සියයට 69 ක වැඩි වීමක් පෙන්නුම් කළ අතර, ශුද්ධ මූල්‍ය හිඟය/දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතය සියයට 9 සිට 1985 දී සියයට 14 දක්වා වැඩි විය.

# රජයේ ආදායම සහ වියදම




ශ්‍රී ලංකා මහ බැංකුව.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

ශුද්ධ මූල්‍ය හිඟය පියවීමේදී රුපියල් දශ ලක්ෂ 11,105 ක් විදේශීය සම්පත් මගින් ලබා ගන්නා ලදී. විදේශීය ණය සහ දීමනා ශුද්ධ මූල්‍ය හිඟයෙන් සියයට 48 ක් වූ අතර, 1984 දී එය සියයට 72 ක් විය. කෙසේ වුවද, ශුද්ධ මූල්‍ය හිඟය පියවීමේදී උපයෝජනය කළ විදේශීය සම්පත් ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් සේ ගත් කල, 1984 දී සියයට 6 සිට 1985 දී සියයට 7 දක්වා ආන්තික වශයෙන් වැඩි විය. ව්‍යාපෘති, භාණ්ඩ සහ අනෙකුත් මාර්ග යන්ගෙන් ලබා ගත් විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,109 ක්වූ අතර, එය 1984 දී රුපියල් දශ ලක්ෂ 6,492 ක් විය. මුළු විදේශීය දීමනා ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,996 ක් වූ අතර, එය 1985 මුළු විදේශීය මූල්‍යකරණයෙන් සියයට 36 ක් විය. 1984 දී මෙම අනුපාතය සියයට 34 ක් විය.

බැංකු නොවන මූලයන්ගෙන් ලබා ගත් ශුද්ධ සම්පත් ප්‍රමාණය ඉකුත් වසරට වඩා ආන්තික වශයෙන් අඩු වෙමින් රුපියල් දශ ලක්ෂ 5,916 ක් විය. බැංකු නොවන මූලයන්ගෙන් ණය ගැනීම් ශුද්ධ මූල්‍ය හිඟයෙන් සියයට 26 ක් වූ අතර, සේවක අර්ථ සාධක අරමුදලෙන් ලබා ගත් රුපියල් දශ ලක්ෂ 2,748 කින්ද, ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙතින් ලද රුපියල් දශ ලක්ෂ 1,777 කින්ද, ඍජු පාලනයට හසු වන හා හසු නොවන අනෙකුත් මූලයන්ගෙන් ලත් රුපියල් දශ ලක්ෂ 755 කින්ද මෙම ණය සමන්විත විය.


වසර තුළදී බැංකු ණය මත රඳියාවේ වැඩි වීමක් පෙන්නුම් කරමින්, බැංකු ක්‍රමයෙන් වූ ණය ලබා ගැනීම් රුපියල් දශ ලක්ෂ 7,127 ක් විය. එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5 කට සමාන ප්‍රමාණයකි. බැංකු ක්‍රමයෙන් ලබා ගත් සම්පත් මගින් පසුගිය වසරේ රුපියල් දශ ලක්ෂ 2,095 ක සංකෝචනාත්මක බලපෑමට ප්‍රතිවිරුද්ධව මෙම වසරේ රුපියල් දශ ලක්ෂ 6,029 ක ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරනු ලැබින.

**රාජ්‍ය ණය**

අයවැය හිඟය මූල්‍යකරණය සඳහා දේශීය හා විදේශීය ණය ගැනීම් අඛණ්ඩව යොදා ගනු ලැබූ අතර, ඒ හේතුවෙන් නොපියවන ලද රාජ්‍ය ණය ප්‍රමාණය 1984 දී රුපියල් දශ ලක්ෂ 105,918 සිට 1985 දී රුපියල් දශ ලක්ෂ 130,870 දක්වා ඉහළ නැගිණ. නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ඉක්මවූ රාජ්‍ය ණය වර්ධනය හේතුකොට ගෙන 1984 දී සියයට 69 ක්වූ රාජ්‍ය ණය/ද.දේ.නි. අනුපාතය 1985 දී සියයට 82 ක් විය. නොපියවන ලද දළ රාජ්‍ය ණය ප්‍රමාණය, දේශීය ණය රුපියල් දශ ලක්ෂ 63,197 කින් සහ විදේශීය ණය රුපියල් දශ ලක්ෂ 67,673 කින් සමන්විත විය. පසුගිය වසර සමග සැසඳීමේදී, දේශීය ණය සියයට 21 කින් වැඩි වූ අතර, විනිමය අනුපාතිකයෙහි උච්චාවචනයන් නිසා ඇති වූ අතිරේක වගකීම් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 6,883 ක්ද ඇතුලත්ව, විදේශීය ණය සියයට 26 කින් වැඩි විය. කෙසේ වුවද, විනිමය අනුපාතිකයේ උච්චාවචනයන් නිසා ඇති වූ වගකීම් රහිතව සැලකූ විට, විදේශීය ණය ප්‍රමාණය වර්ධනය වූයේ සියයට 13 කිනි. රාජ්‍ය ණය වල වර්ධනයක් පිළිබිඹු කරමින් විදේශීය ණය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් වශයෙන් 1984 දී සියයට 35 සිට 1985 දී සියයට 42 දක්වා වැඩි වූ අතර, දේශීය ණය/ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 34 සිට සියයට 39 දක්වා ඉහළ නැගුණි. 1985 වසර අවසානයේදී නිදන් අරමුදල් අඩු කළ පසු රාජ්‍ය ණය ප්‍රමාණය සියයට 29 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 123,720 ක් විය.

මුළු ණය වලින් සියයට 48 ක් වූ දේශීය ණය, දිගු හා මැදි කාලීන ණය රුපියල් දශ ලක්ෂ 36,689 කින්ද, කෙටි කාලීන ණය රුපියල් දශ ලක්ෂ 26,508 කින්ද සමන්විත විය. දිගු හා මැදි කාලීන ණයවල වැඩිවීම පසුගිය වසරට වඩා සියයට 10 ක් වූ අතර, කෙටිකාලීන ණය වල වැඩිවීම සියයට 40 ක් විය. ඒ අනුව, මුළු දේශීය ණයෙහි දිගු හා මැදි කාලීන ණය ප්‍රමාණය සියයට 64 සිට සියයට 58 දක්වා අඩු වූ අතර, කෙටි කාලීණ ණය වල එම ප්‍රමාණය සියයට 36 සිට සියයට 42 දක්වා වැඩි විය. 1985 අවසානයේදී නොපියවූ ණයවල සංයුතිය, පසුගිය වසරේ සංසන්දනාත්මක දත්තයන් සමග 1.42 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

# රාජ්‍ය ණය සංයුතිය




* දළ රාජ්‍ය ණය වලින් නිදහස් අරමුදල් අඩුකල පසු.

ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.42 සංඛ්‍යා සටහන
### රාජ්‍ය ණය

| ප්‍රභවය | රුපියල් දශ ලක්ෂ | | | | වෙනස ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | නොපියවූ | | වෙනස | | | |
| | 1984 | 1985 | 1984 | 1985 | 1984 | 1985 |
| 1. දේශීය ණය | 52,236·9 | 63,196·7 | - 117·7 | 10,959·8 | - 0·2 | 21·0 |
| 1.1 මැදි හා දිගුකාලීන ණය | 33,323·8 | 36,689·1 | 1,173·7 | 3,365·3 | 3·7 | 10·1 |
| 1.1.1 රුපියල් ණය | 33,227·4 | 36,570·1 | 1,273·8 | 3,342·8 | 4·0 | 10·1 |
| 1.1.2 පරිපාලන ණය | 96·3 | 119·0 | - 100·2 | 22·5 | -51·0 | 23·6 |
| 1.2 කෙටිකාලීන ණය | 18,913·1 | 26,507·6 | -1,291·0 | 7,594·0 | - 6·4 | 40·2 |
| 1.2.1 භාණ්ඩාගාර බිල්පත් | 14,860·0 | 22,280·0 | -2,540·0 | 7,420·0 | -14·6 | 49·9 |
| 1.2.2 බදු සංචිත සහතික පත් | 9·6 | 9·4 | - 0·3 | - 0·2 | - 3·0 | - 2·1 |
| 1.2.3 මහ බැංකු අත්තිකාරම් | 4,043·5 | 4,218·2 | 1,249·0 | 174·7 | 44·7 | 4·3 |
| 2. විදේශීය ණය | 53,680·8 | 67,673·2 | 7,655·7 | 13,992·4 | 16·6 | 26·1 |
| 2.1 ව්‍යාපෘති ණය | 25,971·0 | 36,405·9 | 6,440·0 | 10,434·9 | 33·0 | 40·2 |
| 2.2 ව්‍යාපෘති නොවන ණය | 27,709·8 | 31,267·3 | 1,215·7 | 3,557·5 | 4·6 | 12·8 |
| 2.2.1 භාණ්ඩ | 18,426·3 | 22,372·9 | 538·3 | 3,946·6 | 3·0 | 21·4 |
| 2.2.2 වෙනත් | 9,283·5 | 8,894·4 | 678·0 | - 389·1 | 7·9 | 4·2 |
| එකතුව | 105,917·7 | 130,869·9 | 7,538·0 | 24,952·2 | 7·7 | 23·6 |


මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

මැදි හා දිගු කාලීන දේශීය ණය ආසන්න වශයෙන් සියයට සියයක්ම රුපියල් ණය වූ අතර, 1985 දී සියයට 10 කින් වැඩි විය. පසුගිය වසරේදී එය වැඩි වූයේ සියයට 4 කිනි. වසර තුළදී රුපියල් ණය නිකුත් කිරීම මගින් රුපියල් දශ ලක්ෂ 10,550 ක මුදලක් ලබාගත් අතර, 1984 දී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,344 ක් විය. 1985 දී රුපියල් ණය සඳහා ප්‍රධාන දායකයන් වූයේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව (ජා.ඉ.බැ.) සහ සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.)ය.

1985 වසරේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් රුපියල් දශ ලක්ෂ 5,630 ක් හෙවත් මුළු රුපියල් ණය වලින් සියයට 33 ක දයකත්වයක් දැරීය. මෙය පසුගිය වසරට වඩා සිව් ගුණයකටත් වඩා වැඩි වීමකි. ජාතික ඉතිරි කිරීමේ බැංකුවට ඉහළ මට්ටමක දායකත්වයක් දැරීමට හැකි වූයේ එම බැංකුව විසින් කර තිබූ ආයෝජනවල ලැබීම් ඉහළ යාම නිසාය. ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි පසුගිය වසරෙහි මුළු ඉතිරි කිරීම් ප්‍රමාණය වන රුපියල් දශ ලක්ෂ 2,110 හා සසඳන කල මෙම වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 1,685 ක් විය. එම බැංකුව විසින් කර තිබූ ආයෝජන වලින් ලද ලැබීම් ප්‍රමාණය 1985 දී රුපියල් දශ ලක්ෂ 6,325 ක් වූ අතර, 1984 දී එය රුපියල් දශ ලක්ෂ 2,638 ක් විය. සේවක අර්ථසාධක අරමුදල විසින් රුපියල් ණය සඳහා 1985 වසරේ දී රුපියල් දශ ලක්ෂ 4,418 ක් හෙවත් මුළු රුපියල් ණය වලින් සියයට 42 ක දයකත්වයක් දරණු ලැබූ අතර, එය පසුගිය වසරට වඩා සියයට 40 ක වැඩි වීමකි. මෙම වැඩි වීමට හේතු වූයේ සාමාජික දයකත්වයන් සහ ආයෝජන ආදායම් වෙතින් ලද ඉහළ සම්පත් ප්‍රමාණයයි. 1985 දී සාමාජික දයකත්වයන් මගින් ලත් මුළු ලැබීම් සියයට 21 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 1,921 ක් වූ අතර, ආයෝජන මගින් ලත් අදායම සියයට 30 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 1,552 ක් විය. කල් පිරුණු ආයෝජනයන් මත ආපසු ලැබුණු රුපියල් දශ ලක්ෂ 2,485 ක්ද සේවක අර්ථ සාධක අරමුදල් සතුව පැවතුණි.

වසර තුළදී රුපියල් ණය සඳහා දයකත්වය දරණු ලැබූ අනෙකුත් දයකයන් වූයේ විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් (රුපියල් දශ ලක්ෂ 175), ලංකා බැංකුව (රුපියල් දශ ලක්ෂ 150) දෙපාර්තමේන්තු සහ අනෙකුත් නිල අරමුදල් (රුපියල් දශ ලක්ෂ 125), ජාතික රක්ෂණ සංස්ථාව

# දේශීය ණය සංයුතිය




* දළ දේශීය ණය වලින් නිදන් අරමුදල් අඩු කළ පසු

ශ්‍රී ලංකා මහ බැංකුව.

(රුපියල් දශ ලක්ෂ 29), ජාතික නිවාස නිදන් අරමුදල (රුපියල් දශ ලක්ෂ 19) සහ තැපැල් කාර්යාලයීය සුරක්ෂිත අරමුදල (රුපියල් දශ ලක්ෂ 4) ය. මෙම දයකයන් විසින් රුපියල් ණය සඳහා කළ මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 502 ක්වූ අතර, එය පසුගිය වසරට වඩා තුන් ගුණයක වැඩි වීමකි.

රුපියල් සුරකුම් පත් මගින් කළ සම්පත් උපයෝජනය වර්ෂය තුළදී වැඩි වූ අතර, 1985 සැප්තැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් සුරකුම් පත් සඳහා වූ පොළී අනුපාතිකය සියයට 16 සිට සියයට 14 දක්වා අඩු කරන ලදී. ඒ අනුව රුපියල් දශ ලක්ෂ 7,000 ක වටිනාකමක් හෙවත් මුළු රුපියල් ණය වලින් සියයට 66 ක ප්‍රමාණයක් සියයට 16 ක වාර්ෂික පොළී අනුපාතිකයකින් සහ වර්ෂ 6 ක කල් පිරීමේ කාලසීමාවකින් යුතුව නිකුත් කළ අතර, ශේෂය වූ රුපියල් දශ ලක්ෂ 3,550 හෙවත් රුපියල් ණය වලින් සියයට 34 ක ප්‍රමාණය සියයට 14 ක වාර්ෂික පොළී අනුපාතිකයකින් සහ ඉහත කී කල් පිරීමේ කාලසීමාවකින් යුතුව නිකුත් කරන ලදී.

වසර තුළදී කල් පිරුණු රුපියල් ණය 31 ක් වෙනුවෙන් ණය ආපසු ගෙවීම් ප්‍රමාණය 1985 දී රුපියල් දශ ලක්ෂ 7,208 ක් විය. කෙසේ වුවද, එයින් රුපියල් දශ ලක්ෂ 2,295 ක මුදලක් නිදන් අරමුදල සතුව පැවති සම්පත් වෙතින් පියවන ලදී.


1984 දී රුපියල් දශ ලක්ෂ 2,540 ක ශුද්ධ ආපසු ගෙවීමක් සමග සසඳන විට වසර තුළදී භාණ්ඩාගාර බිල්පත් මගින් කළ මුළු ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,420 ක් විය. ඒ අනුව 1985 වසර අවසානයේදී නොපියවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 22,280 ක් වූ අතර, 1984 දී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 14,860 ක් විය.

මහ බැංකුව විසින් රජයට දෙන ලද තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය 1985 දී රුපියල් දශ ලක්ෂ 175 කින් වැඩි වූ අතර, ඉකුත් වසරේ වූ වැඩිවීම රුපියල් දශ ලක්ෂ 1,249 ක් විය. විශේෂ ණය වශයෙන් 1980 දී ලබාගත් රුපියල් දශ ලක්ෂ 308 ක් සහ 1983 දී ලබාගත් රුපියල් දශ ලක්ෂ 277 ක්ද ඇතුලත්ව 1985 අවසානයේදී මහ බැංකුව අත්තිකාරම් මත වූ නොපියවූ රජයේ ණය වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,218 ක් විය. නොපිය වූ විදේශීය පරිපාලන ණය ගැනීම් ප්‍රමාණය 1984 දී රුපියල් දශ ලක්ෂ 96 සිට 1985 දී රුපියල් දශ ලක්ෂ 119 දක්වා වැඩිවිය. වසර තුලදී පරිපාලන ණය ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 8 ක් විය.

නො පියවූ මුළු රාජ්‍ය ණය වලින් සියයට 52 ක් වූ නොපියවූ විදේශීය ණය ඉකුත් වසරට වඩා සියයට 26 ක වැඩිවීමක් පෙන්වීය. මුළු විදේශීය ණය වලින්, වාණිජමය ණය කොන්දේසි යටතේ ලබාගත් නො පියවූ ණය රුපියල් දශ ලක්ෂ 8,205 ක්වූ අතර, ඉකුත් වසරට වඩා සියයට 11 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. කෙසේ වුවද, මුළු විදේශීය ණය වලින් වාණිජමය ණය සඳහා අදාල කොටස සියයට 14 සිට 1985 දී සියයට 12 දක්වා අඩුවිය.

වසර තුළදී විදේශීය ණය යටතේ දළ ලැබීම් ඉකුත් වසරට වඩා සියයට 1 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 8,898 ක් විය. සමස්ත අයවැය හිඟයෙන් විදේශීය දළ ණය ගැනීම් ප්‍රමාණය සියයට 30 ක් වූ අතර, 1984 දී එය සියයට 56 ක් විය. වාණිජමය ණය වශයෙන් ලබාගත් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 476 ක් වූ අතර, ඉකුත් වසරේදී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,624 ක් විය. වසර තුළදී විදේශීය ණය ආපසු ගෙවීම් රුපියල් දශ ලක්ෂ 1,789 ක් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 1985 දී ශුද්ධ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 7,109 ක් විය. 1984 දී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,373 ක් විය.

# විදේශීය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව.

රුපියල් දශ ලක්ෂ 8,318 ක් වූ රාජ්‍ය ණය මත පොළී ගෙවීම් ප්‍රමාණය සියයට 14 ක වැඩි වීමක් පෙන්නුම් කළ අතර, ඉකුත් වසරේදී එම වැඩිවීම සියයට 10 ක් විය. දේශීය ණය මත පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 6,477 ක් වූ අතර, විදේශීය ණය මත පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 1,841 ක් විය. වසර තුළදී දේශීය ණය මත පොළී ගෙවීම් සියයට 12 කින් වැඩි වූ අතර, ඉකුත් වසරේදී එම වැඩිවීම සියයට 9 ක් විය. විදේශීය ණය මත පොළී ගෙවීම් සියයට 25 කින් වැඩි වූ අතර, ඉකුත් වසරේදී එම වැඩිවීම සියයට 16 ක් විය.

වසරේ මැද භාගයේදී පැවති ඉහළ පොළී අනුපාතිකයන් යටතේ විශාල ප්‍රමාණයක නොපියවූ බිල්පත් ප්‍රමාණයක් සේවාකරණය කිරීම මූලික වශයෙන් හේතුකොට ගෙන භාණ්ඩාගාර බිල්පත් මත පොළී ගෙවීම් සියයට 17 කින් වැඩි විය. ඒ අනුව මුළු දේශීය ණය මත පොළී ගෙවීම් වලින් භාණ්ඩාගාර බිල්පත් මත පොළී ගෙවීම සඳහා අදල කොටස සියයට 33 සිට සියයට 35 දක්වා ඉහළ නැගුණි. අනෙක් අතට රුපියල් ණය සඳහා වූ පොළී ගෙවීම් සියයට 9 කින් ඉහළ නැගුන අතර, ඉකුත් වසරේදී එය සියයට 21 කින් වැඩි වුණි. වර්ෂය තුල රුපියල් ණය ප්‍රමාණය වැඩි වුවද, පොළී ගෙවීම් වල වැඩිවීම එතරම් සීඝ්‍ර නොවූයේ පොළී අනුපාත පහත දැමීම නිසාය. කෙසේ වුවද, විදේශීය පරිපාලන ණය මත පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 30 ක් ලෙස නොවෙනස්ව පැවතුනි.

විදේශීය ණය සඳහා පොළී ගෙවීම් ව්‍යාපෘති ණය සඳහා රුපියල් දශ ලක්ෂ 604 කින්ද, භාණ්ඩ ණය සඳහා රුපියල් දශ ලක්ෂ 534 කින්ද, වෙනත් ණය සඳහා රුපියල් දශලක්ෂ 703කින්ද සමන්විත විය. විදේශීය ණය ගැනීම් වල සැලකිය යුතු ඉහල යාමක් මෙන්ම වාණිජමය කොන්දේසි යටතේ ලබාගත් ණය ප්‍රමාණයේ වැඩි වීමක්ද, පිලිබිඹු කරමින්, විදේශීය ණය මත පොළී ගෙවීම් ඉකුත් වසරට වඩා සියයට 25 කින් වැඩි විය. ඒ අනුව වාණිජමය ණය මත පොළී ගැනීම් සඳහා වූ රුපියල් දශ ලක්ෂ 893 ක් විදේශීය ණය මත පොළී ගෙවීම් හි ඇතුළත් විය. 1984 දී එය රුපියල් දශ ලක්ෂ 679 ක් විය. මෑත කාලයේදී පැවති ප්‍රවනතාවන් තව දුරටත් පිළිබිඹු කරමින් පොළී ගෙවීම් වර්තන වියදම් වල ප්‍රතිශයක් වශයෙන් සියයට 21 සිට සියයට 23 දක්වා වැඩි විය. කෙසේ වුවද, පොළී ගෙවීම්/ද.දේ.නි. අනුපාතය පසුගිය වසරේ මෙන්ම සියයට 5 ක් විය.

මුළු ණය සේවා ගෙවීම (ණය පොළී සහ ණය ආපසු ගෙවීම්) පසුගිය වසරට වඩා සියයට 58 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1985 දී රුපියල් දශ ලක්ෂ 15,044 ක් විය. මෙය නිදන් අරමුදල් සඳහා මුදල් වෙන් කිරීම නවතා දැමීම හේතු කොට ගෙන ඍජු ණය ආපසු ගෙවීම් සඳහා වූ වියදම ඉහළ යාමේ ප්‍රතිඵලයකි. 1985 වසරේ වැඩි වූ ණය සේවා වියදම් සහ අඩු වූ රජයේ අදයම් වල ප්‍රතිඵලයක් වශයෙන් ණය සේවා ගෙවීම් රජයේ අදයමට සාපේක්ෂව සියයට 25 සිට සියයට 40 දක්වා වැඩි විය.